සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024 . 02 . 12

De Mazenod College Kandana

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

58051

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි

## I කොටස

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. "සුදහ ගින්දරේ" පසුවන ඇයගේ කුසට අවැසි වූයේ කුඩා හෝ ආහාරයයි.
    1. දැඩි උණුසුමෙන් 2. දැඩි කනස්සල්ලෙන් 3. අධික වේදනාවෙන් 4. අධික බඩගින්නෙන්

02. "ඕනෑ නම් මේ ලෙඩේ සිකුරට ම හොඳ කළ හැකි යි" වෙදරාළ කීවේ ය.
    1. සිකුරු ග්‍රහයාට අනුව ම 2. ස්ථිරව ම 3. සිකුරාදා දිනයේ දී 4. මද වේලාවකින්

- පහත ඉරි ඇඳි පදයට සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

03. විකසිත පුෂ්පයෙන් පරිසරය අලංකාර කරති.
    1. අලංකාරවත් 2. පරවුණු 3. මැලවුණු 4. පිපුණු

04. සිරිමලී උඩඟු ස්ත්‍රියක් වූවා ය.
    1. නිරහංකාර 2. නිහඬ 3. අහංකාර 4. අවංක

05. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති ව්‍යංජන අක්ෂර ගණන කීය ද?
    1. 18 කි 2. 60 කි 3. 40 කි 4. 42 කි

06. "නොපෙනෙන තෙක් ඈත මගුල් ගෙයක් වගේ"
    1. මෙහි යෙදී ඇත්තේ උපමාවකි. 2. මෙහි යෙදී ඇත්තේ විශේෂණ පදයකි.
    3. මෙහි යෙදී ඇත්තේ සමාන පදයකි. 4. මෙහි යෙදී ඇත්තේ ප්‍රස්තාව පිරුළකි.

07. හල් කළ හැකි ව්‍යඤ්ජන අක්ෂර වන්නේ කුමක් ද?
    1. ඡ 2. ඕ 3. ම 4. ද

08. පහත දැක්වෙන වචනයේ ස්වර හා ව්‍යඤ්ජන වෙන්කර ලියා දක්වන්න
    කෞතුකාගාරය

09. මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචන පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    1. උච්චාරණය, ශෛලිය, අමනුෂ්‍ය 2. ධර්මය, භයානක, ඡන්දය
    3. නාට්‍යය, ලක්ෂණ, ප්‍රතිඵලය 4. ඓක්‍යය, ඖෂධ, ශක්තිය

- ඉරි ඇඳි පදයේ පිල්ලම නම් කරන්න.

10. තාත්තා කපාදුන් තැඹිලි ගෙඩිය පානය කළ මාමා "අමෘතය" වාගේ යැයි පැවසුවේය.
    1. ගයනුකිත්ත 2. ඇලපිල්ල 3. කොම්බුව 4. ගැටපිල්ල
11. ලබා දුන් ඖෂධවල බලපෑමෙන් ඇය රෝහල් ගත කළා ය.
    1. ගයනුකිත්ත 2. ඇලපිල්ල 3. කෙටි පාපිල්ල 4. ගැටපිල්ලක්
12. පහත සඳහන් නිර්මාණ රචනා කළ රචකයන් පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.
    (උදය සිරි / සිරිත්මල්දම / හීන්සැරය)
    1. කුමාරතුංග මුනිදාස, ඇස්. මහින්ද හිමි, ගුණදාස අමරසේකර
    2. ඇම්. ඇල්. සිල්වා, ඇස්. මහින්ද හිමි, කුමාරතුංග මුණිදාස
    3. ඇස්. මහින්ද හිමි; ඩේවිඩ් කරුණාරත්න, ඇම්. ඇල්. සිල්වා
    4. ඇස්. මහින්ද හිමි, ඇම්. ඇල්. සිල්වා, කුමාරතුංග මුනිදාස
13. උක්ත වචන හා අනුක්ත පද සමානව ඇති වරණය තොරන්න.
    1. ගවයා, ගස, ඇතමෙක්, ගුරුතුමා 2. කුරුල්ලෙක්, අම්මා, ගැහැණියක්, වඳුරන්
    3. මැස්සන්, ගම්වැසියෝ, කවිහු, තාරකාවෝ 4. මිනිසුන්, කුරුල්ලන්, වෛද්‍යවරු
14. "පිපී ගියා වූ ගන මුකලන් කැලේ
    මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙති"
    මෙම කවි පදයේ ඇතුළත් විශේෂණ පදය කුමක් ද?
    1. පිපී 2. මලේ කොළේ 3. ගන මුකලන් 4. මෙසේ මෙසේ
15. "අර අර බලන්න එළිය පාත් වෙනවා ඉස්සෙනවා ආයිත් ගමන් කරනවා"
    ඉහත සඳහන් වාක්‍යය විරාම ලකුණු යොදා නැවත ලියන්න.

    ............................................................................................................................................

16. දිළිඳු ගැහැණු දරුවා සුලබ වූ පලතුරු අඩු මිලට මිළ දී ගනිමින් සොම්නස පැවා ය.
    ඉහත ඉරි ඇඳි පද සඳහා සුදුසු විරුද්ධ පද ඇතුළත් වරණය වනුයේ,
    1. දුප්පත්, බහුල, ආදරය 2. ධනවත්, දුලබ, දොම්නස
    3. දුර්වල, සුවච කීකරු, 4. දිනිදු, බහුල, දොම්නස
17. පහත සඳහන් වාක්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.
    "ඔවුහු සතුටින් සත්ත්ව උද්‍යානය නැරඹීමට ගිය හ"
    1. මධ්‍යම පුරුෂ අතීත කාල ඒක වචන වාක්‍යයකි. 2. ප්‍රථම පුරුෂ බහුවචන අතීතකාල වාක්‍යයකි.
    3. මධ්‍යම පුරුෂ වර්තමාන කාල බහුවචන වාක්‍යයකි. 4. ප්‍රථම පුරුෂ බහුවචන වර්තමානකාල වාක්‍යයකි.
18. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. උක්තය ප්‍රාණවාචී ඒක වචන නම් ආඛ්‍යාතය බහු වචන වේ.
    2. උක්තය අප්‍රාණවාචී බහු වචන නම් ආඛ්‍යාතය බහු වචන වේ.
    3. උක්තය අප්‍රාණවාචී ඒක වචන නම් ආඛ්‍යාතය බහු වචන වේ.
    4. උක්තය අප්‍රාණවාචී ඒක වචන වුවත් බහු වචන වුවත් ආඛ්‍යාතය ඒක වචන වේ.
19. ඉරි ඇඳි පද වෙනුවට යෙදිය හැකි යුගල පද පිළිවෙලින් ඇති වරණය තෝරන්න.
    "තාත්තා අමුත්තා සමග දබර නොවී පිළිසඳරෙහි යෙදෙමින් තොරතුරු විමසන්නට"
    1. රැවුම් ගෙරවුම්, කියුම් කෙරුම්, වංහුං 2. රණ්ඩු සරුවල්, ගුණ දොස්, වංහුං
    3. සට කපට, ගුණ දොස්, ඉඳුම් හිටුම් 4. හදි හූනියම්, කතා බහ, ඉඳුම් හිටුම්
20. ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
    1. අපි විශාල පර්වතයක් මුදුනට අමාරුවෙන් නැංගේ ය.
    2. වැසි සමයේ ගංගා පිරී ඉතිරී ගිය හ.
    3. උදෑසන විවිධ කුරුල්ලෝ අහසේ පියාඹති.
    4. ඔවුහු මුහුදු වෙරළේ සෙල්ලම් කරන්නේ ය.

## II කොටස

- 01 හා 02 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්න අතුරින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පන්ති කාමරයේ දී ඔබ කණ්ඩායම විසින් සිදුකරන ලද ක්‍රියාකාරකමක් ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(භාෂාවක් මගින් අදහස් පළ කරන එකම සත්ත්වයා මනුෂ්‍යයා ය. අදහසක් හෝ හැඟීමක් කියාපෑමට මනුෂ්‍යයාගේ මුවෙන් පිටවන අර්ථයක් සහිත ශබ්ද පද යනුවෙන් හැඳින්වේ. පද වර්ග කිහිපයකි.)

i. ඔබ කණ්ඩායමට 'පද වර්ග' ඇසුරින් කුඩා පොත් පිංචක් සැකසීමට අවස්ථාව සැලසුණි. ඒ සඳහා යෝජනා කරන ලද ප්‍රධාන මාතෘකා 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. ක්‍රියාකාරකම සඳහා කරුණු සොයාගත් මූලාශ්‍ර 04 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. පොත් පිංච නිර්මාණය කිරීමේ දී ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

iv. 'පද වර්ග' නම් මාතෘකාව ඔබ විසින් බෙදා දැක්වූ අනු මාතෘකා 04 ක් නම් කරන්න. (ලකුණු 04)

v. මෙම ක්‍රියාකාරකමෙහි නියැළීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. සාරධර්ම ජීවිතයට එකතුකර ගනිමු.

ii. කියවීම මිනිසා සම්පූර්ණ කරයි.

iii. පරිසරය සුරකිමු.

iv. ජල සම්පත සුරකිමු.

v. පුංචි පැලේ ගස වෙනා. (ලකුණු 14)

03. දීර්ඝ කාලයක් ඔබ පාසලේ සේවයේ යෙදී සිට වෙනත් පාසලකට ස්ථාන මාරුවීමක් ලබා ඔබගෙන් වෙන් වී යන ඔබ පාසලේ සිංහල විෂය භාර ගුරුභවතාට සුබ පතා ඔබ විසින් සුබ පැතුම් පත් සකස් කරන්න.

නැතහොත්

ඔබ පාසලේ පැවැත්වූ නත්තල් උත්සවය පිළිබඳව ඔබ ලැබූ අත්දැකීම් පිළිබඳව ඔබේ විදේශ ගත වී සිටින තාත්තාට ලියන ලිපිය ලියන්න. (ලකුණු 10)

04. පහත සඳහන් ප්‍රකාශයන් කා විසින් කා හට කියන ලද දැයි ලියා දක්වන්න.

i. "මට මලය රටින් ලැබුණකි. මේ ප්‍රණීත මාංසයකි."

ii. "කුමක් නිසා උනු ද? පොකුණට බැස පැන් බොව."

iii. මාගේ පරම මිත්‍ර වූ තොපි මට කවර හෙයින් දාමරික වූහු ද?

iv. "එසේය දේවයන් වහන්ස බලු ගැත්තා එම සේවයෙහි යෙදී සිටියේ ය." (ලකුණු 10)

05. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. මම පුස්තකාලයට යමි.

ii. ඔබ සෙල්ලම් කරන්නෙහි.

iii. ගැමියෝ කුඹුරු වැඩ කරති.

iv. සංචාරකයෝ දළඳා මාළිගයට යති. (ලකුණු 10)

06. පහත දැක්වෙන කවිය කියවා ඒ ඇසුරෙන් ඔබේ සිතට නැගුණු අදහස් කෙටියෙන් ලියන්න.

"පිපේ නෙළුම් ඕලු ගගේ විලේ ඇලේ
තිබේ වලාකුළු පහවී නිලේ වෙලේ
නො පේන තෙක් ඇත මඟුල් ගෙයක් වගේ
සැදී සිටින්නේ ද ගසුත් වැලුත් ගලුත්"

(ලකුණු 10)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාව බතින් බුලතින් පෝෂණය කිරීමට අධිෂ්ඨාන කරගත් පාලකයෙක් පස්වන සියවසේ දී කලා වැව හා බදුලු වැව යන වැව් යුගල එක් කර විශාල ජලාශයක් ඉදි කළේ ය. ඒ ධාතුසේන රජු ය. මෙසේ විශාල ජලාශයක් කළ රජතුමා එම ජලය අඩි 40 ක් පමණ පළල යෝධ ඇල ඔස්සේ සැතපුම් 54 ක් දුර ඇති අනුරාධපුරය ට ගෙන ගියේ ය. සියවස් දහසකට පෙර එබඳු මහා පරිමාණයේ ඇළක් එවන් භූමි භාගයක නිර්මාණය කළේ කෙසේ ද යන්න විමතියට කරුණකි. පළමු සැතපුම් දහයේ දී එය සෙමෙන් ගලා යන්නේ සැතපුමකට අඟල් හයක් පමණ බෑවුමක් ඇතිව ය.

i. ධාතුසේන රජතුමා මෙරට පාලකයා ව සිටියේ මීට කොපමණ කලකට පෙර ද?
ii. ශ්‍රී ලංකාව බතින් බුලතින් පෝෂණය කිරීමේ අරමුණින් ධාතුසේන රජතුමා කළ කාර්යය කුමක් ද?
iii. කලා වැවේ ජලය අනුරාධපුරයට ගෙන යාම සඳහා යෙදූ උපක්‍රමය කුමක් ද?
iv. පළමු සැතපුම් 17 තුළ යෝධ ඇළේ ආනතිය කොපමණ වේ ද?
v. ඡේදයේ සඳහන් වාරි තාක්ෂණික නිර්මාණ කවර යුගයකට අයත් වේ ද? (ලකුණු 10)